පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය : පෙරදිග සංගීතය

සතිය : හත්වන සතිය

ශ්‍රේණිය : 06

සකස් කිරීම : W.S.D. ලසන්ත ප්‍රනාන්දු මයා
කෑ/මාව/දැලිවල ම.වි

# මූලික තාල මත පද ප්‍රස්තාර කිරීම

ප්‍රස්තාරකරනයේදී ලඝු, ගුරු, ප්ලුත අක්ෂර සහ එම අක්ෂර වලට අයත් මාත්‍රා ගණන පිළිබඳ අවබෝධයක් සහිතව ප්‍රස්තාරකරණය කලයුතුය. ස්වර ප්‍රස්ථාර කිරීම මෙන්ම ගී පද ද තාලානුකූලව ප්‍රස්තාර කළයුතුවේ. ප්‍රස්තාරකරණයේ දී අක්ෂරවල ඇදීමක් ඇති විට ‘S’ යන සංකේතය සහ ස්වර ප්‍රස්තාරයකදි ‘-’ සංකේතය භාවිතා කරයි. කිසියම් ගීතයක තාලයට අදාලව මාත්‍රා කැටිකර දැක්වීමේදී එහි එක් කොටසක් විභාගයක් ලෙස ගනු ලබයි. මූලික තාල වන 2x2 (ලාවනී), 3x4 (දාදරා), 4x4 (ත්‍රිතාල්) යන තාල මත පද ප්‍රස්තාර කරමු.

- මාත්‍රා දෙකෙන් දෙකට තාලය යෙදෙන ගීතයක් ප්‍රස්තාර කරන ආකාරය

| 1 | 2 | 1 | 2 | 1 | 2 | 1 | 2 |
|---|---|---|---|---|---|---|---|
| කි | රි | සු | දු | හා | S | වා | S |
| පැ | න | පැ | න | ආ | S | වා | S |

- මාත්‍රා තුනෙන් තුනට තාලය යෙදෙන ගීතයක් ප්‍රස්තාර කරන ආකාරය

| 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ස | ව | න | පි | න | න | ගී | S | ත | මි | හි | ර |
| වි | ළි | මු | හ | ද | පු | රා | S | S | S | S | S |

- මාත්‍රා හතරෙන් හතරට තාලය යෙදෙන ගීතයක් ප්‍රස්තාර කරන ආකාරය

| 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| දි | ය | ගො | ඩ | සැ | ම | තැ | න | කි | රි | ඉ | ති | රේ | S | S | S |
| ග | ස් | වැ | ල් | කි | රි | මු | හු | දේ | S | කි | මි | දේ | S | S | S |

## පැවරුම්

01- තාල පද මත ප්‍රස්තාර කරණයේදී සැලකිලිමත් විය යුතු කරුණු 02 ලියන්න

02- විභාග යනු කුමක්ද?

03 - මාත්‍රා 2x2, 3x4, 4x4 යන තාල වලට ගමන් කරන ගීත කොටස් 02 බැගින් ප්‍රස්තාරකරන්න

04- පහත සඳහන් ගීත ගමන් කරන තාලය අනුව වර්ග කර ප්‍රස්තාරකර දක්වන්න

1 නිල් අහස් තල් අගේ
2 රන් වන් පාටයි සමනලයා
3 කඳුපෙළ අතරේ තුරු වදුලේ
4 වැල් වැල් දික් ඇති
5 සුවඳ පද්ම ඕළු ආදි
6 බැතිනා සිරිපා කරුණා කරන